සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 4

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021 ජුලි මාසය

සැකසුම : ඉදුමිණී ශ්‍යාමා මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 9.පාඩම - අග්‍රශ්‍රාවිකා දෙනම

දුවේ පුතේ අපි ගිය සතියෙ ඉගෙන ගත්තා ආනන්ද හිමියන් ගැන.උන් වහන්සේ කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම් ආදී කරුණු ගැන.

ඉතින් අප සම්මා සම්බුදු බුදුරජාණන් වහන්සේගේ සසුනේ අග්‍රශ්‍රාවිකා දෙනම පිළිබඳ දැන ගන්න ඔයාලා කැමතියි නේද?

එහෙමනම් අපි ආයේ බුද්ධ ධර්මය පෙළපොත අතට අරගෙන 9 වන පාඩම හොඳින් කියවමු.ලස්සන කවි පන්තියකුත් තියෙනවා නේද?

අපි කවි පන්තිය තාලයට ගායනා කරමු නේද? හොඳයි මගෙ දුවේ පුතේ දැන් ඔයාලට පහත දීල තියෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න පුළුවන්ද බලන්නකෝ.

1).බුදු සසුනේ අග්‍රශ්‍රාවිකා දෙනම නම් කරන්න.

2).බිම්බිසාර රජුගේ අග මෙහෙසිය වූයේ කවුද?

3).බුදු සසුනේ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ විශේෂ හැකියා ඇති භික්ෂුණීන් අතර අග තනතුර ලැබුවේ කවුද?

4).බුදු සසුනේ නැණවත් භික්ෂුණීන් අතර අග තනතුරට පත් වූයේ කවුද?

<u>අග්‍රශ්‍රාවිකා දෙනම</u> පිළිබඳ ඔබ ඉගෙනගත් තොරතුරු ඇසුරින් ඔබේ ජීවිතයට යහපත් ආදර්ශ එකතු කර ගන්න මගේ දුවේ පුතේ.

බුද්ධ ධර්මය විෂයට අදාළ වඩියෝ enanapiyasa වෙබ් අඩවියේ සුහුරු පාඩම් යටතේ ලබාගත හැකිය